# සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවට සංචරණයේ වැදගත්කම

පී.ඒ.ශ්‍යාමලී, එච්.එම්.කේ.ගයනි*

සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවට විදේශ විනිමය සපයාදෙනු ලබන ප්‍රධාන කර්මාන්තයකි. සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයක් ලෙස සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන තිබේ. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ එම රටවල්හි පවතින සංචරණයෙහි ස්වභාවයත්, සංචාරක කර්මාන්තයෙන් ලබන්නා වූ ප්‍රතිලාභයනුත් එම නිසා එයට නැඹුරු වීමේ ස්වභාවයත්, ඒ රාජ්‍යයන්හි සංචරණය ප්‍රවර්ධනය කළ යුතු ආකාරය පැහැදිලි කරගැනීමත් වේ. ලෝකයෙහි අනෙකුත් රාජ්‍යයන් සමග සංසන්දනය කිරීමේ දී සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවට සංචාරක කර්මාන්තය මඟින් හිමිවන ප්‍රතිලාභ රැසකි. දේශපාලනික න්‍යාය පත්‍රයන්හි ද සංචාරක කර්මාන්තය ජාතික ආදායමට දක්වන දායකත්වය රාජ්‍ය ප්‍රතිපත්තින් ලෙස පිළිගැනීම දක්වා අවබෝධාත්මක සැලසුම් සංග්‍රහිත වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන තිබිම සුවිශේෂී වේ. පර්යේෂණයෙහි අතිරේක අරමුණු ලෙස සංචරණය සඳහා සංචාරකයන් ඇදී ඒමත්, සංවර්ධන උපක්‍රමයක් ලෙසින් සංචාරක කර්මාන්තය යොදා ගැනීමත්, 1960 දශකයෙන් පසුව ශ්‍රී ලංකාව රාජ්‍යයක් ලෙස ඉදිරිපත් කරන ලද සංචාරක සැලසුම්, ඒවායේ සංවිධිත හා අසංවිධිත ස්වභාවය හඳුනාගැනීම ද, සාමකාමී රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට ඇති අවස්ථා හඳුනා ගැනීමත්, නව සංචාරක ප්‍රවණතාවයන් හඳුනා ගැනීමත් දැක්විය හැකි ය. ගුණාත්මක අධ්‍යයන ක්‍රමවේද යටතේ එන දත්ත විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ අධ්‍යයනය සිදුකළ අතර පසුගිය පර්යේෂණ වාර්තා, සාහිත්‍ය මූලාශ්‍ර සහ අන්තර්ජාලය භාවිත කරමින් ද්විතීක දත්ත යොදාගන්නා ලදි. අධ්‍යයනයෙන් අනාවරණය කරගත් තොරතුරුවලට අනුව අඩු ආයෝජන සහිත සංචාරක ආකර්ෂණයන් මෙන් ම ස්වභාවික සහ සංස්කෘතිකමය ආකර්ෂණයන් ද ප්‍රවර්ධනය කිරීම හඳුනාගෙන තිබේ. 85% ක් පමණ වූ ග්‍රාමීය පරිසරයක් ආරක්ෂා වී ඇති ශ්‍රී ලංකාවෙහි සංචාරක ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම සඳහා එක් පසෙකින් වැදගත් අවස්ථාවන් නිර්මාණය වී තිබේ. ග්‍රාමීය ජනතාව මත ආරක්ෂා වී ඇති අස්පර්ශීය හා ස්පර්ශීය සංස්කෘතික අංගයන් ද ස්වභාවික පරිසර පද්ධතිය මෙන් ම ජීවන පැවැත්ම ද සංචාරක ව්‍යාපරය ප්‍රවර්ධනය කිරීමෙහි ලා මහඟු ආයෝජනයන් වේ. ඒ අනුව මෙම තත්ත්වය සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ඉදිරි පැවැත්ම සඳහා බලාත්මක කිරීම සඳහා සාධනීය කාරණයක් වේ.

ප්‍රමුඛ පද- සංවර්ධනය වෙමින් පවතින රටවල්, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය, රාජ්‍ය ප්‍රතිපත්ති, ග්‍රාමීය ජනතාව, ප්‍රවර්ධනය

* පුරාවිද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය. ganushashyamalee@gmail.com/ gkawshi25@gmail.com